# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත

---

**[සහතිකය සටහන් කළේ 2007 නොවැම්බර් මස 13 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2007 නොවැම්බර් මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ
II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි**

## 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත

[සහතිකය සටහන් කළේ 2007 නොවැම්බර් 13 වන දින]

එල්.ඩී.— ඕ. 61/2003.

**ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන්ට ප්‍රතිකාර කිරීම සහ ඔවුන් පුනරුත්ථාපනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළකරන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට ක්‍රියාත්මක වන්නේය. ලුහුඬු නාමය.

### I වන කොටස

### ප්‍රතිකාර මධ්‍යස්ථාන

**2**. මේ පනතේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් (මෙහි මින් මතු "එන්. ඩී. ඩී. සී. බී." යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික අන්තරායදායක ඖෂධ පාලක මණ්ඩලයේ නිර්දේශය මත, ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් ( මෙහි මින් මතු "ප්‍රතිකාරක මධ්‍යස්ථානය " යනුවෙන් සඳහන් කරනු ලබන) යම් ස්ථානයක් හෝ ගොඩනැගිල්ලක්, ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් රැකබලා ගැනීම හා පුනරුත්ථාපනය සඳහා වූ මධ්‍යස්ථාන වශයෙන් නම් කරනු ලැබිය හැකි ය. ප්‍රතිකාර මධ්‍යස්ථාන.

**3**. (1) ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් රැකබලා ගැනීම හා පුනරුත්ථාපනය සඳහා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ඉල්ලුම්පත්‍රයක් ඒ ඉල්ලුම්පත්‍රයේ නිශ්චිතව දැක්වෙන පරිශ්‍රයෙහි පිහිටුවීම පිණිස කවර හෝ තැනැත්තකු විසින් ඔහු වෙනුවෙන් ම හෝ යම් සංස්ථාගත හෝ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක් වෙනුවෙන් හෝ එන්.ඩී.ඩී.සී.බී. වෙත ඉදිරිපත් කළ හැකි ය. පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානවලට බලපත්‍ර දීම.

(2)(අ) අදාළ පරිශ්‍රය ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ලෙස ප්‍රයෝජනයට ගැනීම සඳහා යෝග්‍යවන පරිදි සැලසුම් කර තිබෙන බවට ;

2—PL 002497—3,600 (2007/10)

(ආ) එම මධ්‍යස්ථානයේ පවතින පහසුකම් පනතේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් බවට ;

(ඇ) එම මධ්‍යස්ථානවල සේවයේ නියුක්ත කර තිබෙන කාර්ය මණ්ඩලයට මේ පනත යටතේ ඔවුන්ගේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා ප්‍රවීනත්වයක් තිබෙන බව තහවුරු කිරීම පිණිස නියමිත සුදුසුකම් තිබෙන බවට ; සහ

(ඈ) මධ්‍යස්ථානයේ කළමනාකරණය සඳහා යෝජිත වැඩ පිළිවෙල සතුටුදායක බවට,

එන්.ඩී.ඩී.සී.බී. සෑහීමට පත්වන්නේ නම්, එමගින් අවශ්‍ය යයි සලකන කොන්දේසි, සීමාකිරීම්, හා පරිසීමාවලට යටත් ව එය විසින් ඉල්ලුම්කරුට බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය. එම කොන්දේසි සීමා කිරීම හා පරිසීමාවන් බලපත්‍රයේ සඳහන් කර තිබිය යුතු ය.

ප්‍රතිකාර මධ්‍යස්ථාන අධ්‍යක්ෂවරයා.

4. (1) මේ පනත හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් මගින් ප්‍රතිකාර මධ්‍යස්ථාන අධ්‍යක්ෂවරයා වෙත පැවරී ඇති හෝ නියම වී ඇති යම් බලතල සහ කාර්ය ක්‍රියාවේ යෙදවීම සහ ඉටු කිරීම පිණිස, (මෙහි මින් මතු "අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රතිකාර මධ්‍යස්ථාන අධ්‍යක්ෂවරයකු, අමාත්‍යවරයා විසින් එන්.ඩී.ඩී.සී.බී. හි නිර්දේශය මත, මේ පනතේ කාර්ය සඳහා පත්කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන අනුව ක්‍රියා කරනු ලබන්නේ ද යන වග නිසැකව දැනගැනීමේ කාර්යය සඳහා, අධ්‍යක්ෂවරයා හෝ ඔහු වෙනුවෙන් ක්‍රියාකිරීම පිණිස බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින්, සියලු යුක්ති සහගත වේලාවන්හි දී, මේ පනත යටතේ බලපත්‍ර දී තිබෙන හෝ නාමෝද්දිෂ්ට යම් ප්‍රතිකාර මධ්‍යස්ථානයකට ඇතුලු වී, අවශ්‍ය යයි ඔහු සලකන පරීක්ෂාවක් එහි කළ හැකිය . එම කාර්යය සඳහා අවශ්‍ය යයි ඔහු සලකනු ලබන යම් සහායකයන් ඔහු විසින් ගෙන ආ හැකි ය.

(3) අධ්‍යක්ෂවරයා විසින් එන්.ඩී.ඩී.සී.බී. වෙත, නියමිත කාලාන්තරීය වාර්තා ඉදිරිපත් කළ යුතු අතර, ප්‍රතිකාර මධ්‍යස්ථානවල ප්‍රතිකාර ලබන තැනැත්තන් සංඛ්‍යාවට අදාළව ප්‍රතිකාර මධ්‍යස්ථානවල කටයුතු පිළිබඳව සහ ඖෂධවලට ඇබ්බැහිවූවන්ට ප්‍රතිකාර ලබාදීම හා ඔවුන් පුනරුත්ථාපනය කිරීමෙහිලා ඒ මධ්‍යස්ථානවල සාර්ථකත්වය පිළිබඳව තොරතුරු ඒ වාර්තාවෙහි අන්තර්ගත විය යුතු ය.

5. ප්‍රතිකාර මධ්‍යස්ථානවල කාර්යක්ෂම කළමනාකරණය පිළිබඳව වගබලා ගැනීම පිණිස අවශ්‍ය පොදු හෝ විශේෂ විධාන, ජාතික අන්තරායදායක ඖෂධ පාලක මණ්ඩලය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි ය. ඒ විධාන පිළිපැදීම එම මධ්‍යස්ථානවල කාර්යය වන්නේ ය. එන්.ඩී.ඩී.සී.බී. විසින් විධාන නිකුත් කළ හැකි බව.

6. අන්තරායදායක ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන්ට මේ පනත යටතේ නාමෝද්දිෂ්ට හෝ බලපත්‍රලත් ප්‍රතිකාර මධ්‍යස්ථාන වල දී ප්‍රතිකාර ලබාදීමේ දී සහ ඔවුන් රැකබලා ගැනීමේ දී සහාය වීම පිණිස අවස්ථාවෝචිත පරිදි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගේ හෝ වෙනත් අදාළ බලධරයකුගේ හෝ අනුමැතියට යටත් ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ හෝ යම් විශ්වවිද්‍යාලයක වෛද්‍ය නිලධරයකුගේ හෝ වෙනත් යම් නිලධරයකුගේ හෝ සේවා නියුක්තයකුගේ නැතහොත් යම් වෛද්‍ය වෘත්තිකයකුගේ හෝ ඒ සමාන සේවයක නියුක්ත වෙනත් ප්‍රවීණ තැනැත්තකුගේ සේවය ප්‍රයෝජනයට ගත හැකිය. එවැනි සහාය ලබාදිය යුත්තේ කවර නියම හා කොන්දේසි මත ද යන්න නිශ්චිතව දැක්වෙන නියෝග සාදනු ලැබිය හැකි ය. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ආදියෙහි නිලධාරීන්ගේ සේවය ප්‍රයෝජනයට ගැනීම.

7. (1) අමාත්‍යවරයා විසින් නීති ක්ෂේත්‍රයේ විශිෂ්ඨත්වයට පත් හෝ පළපුරුදු සහිත තැනැත්තන් අතරින් හෝ අන්තරායදායක ඖෂධ ඇබ්බැහිය හා සම්බන්ධ කායික විද්‍යාත්මක හෝ සමාජ ගැටළු යන අංශ පිළිබඳ පළපුරුද්දක් හෝ දැනීමක් ඇති තැනැත්තන් අතරින් දහදෙනෙකුට නොවැඩි තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත තුලනීක්ෂණ මූලමණ්ඩල පත් කරනු ලැබිය යුතු ය. තුලනීක්ෂණ මූල මණ්ඩල පත් කිරීම.

(2) පහත සඳහන් කවර අවස්ථාවක වුව ද, අවශ්‍ය වූ විටක—

(අ) මේ පනත යටතේ නාමෝද්දිෂ්ට හෝ බලපත්‍රලත් ප්‍රතිකාර මධ්‍යස්ථානයකට ඇතුලත් වීමට මේ පනතට අනුකූලව ඉදිරිපත් වන තැනැත්තන් තුලනීක්ෂණය කිරීම; හෝ

(ආ) තත්කාලීනව අන්තරායදායක ඖෂධ ඇබ්බැහියට ප්‍රතිකාර ලබන තැනැත්තන් තුලනීක්ෂණය සහ අනාගත පුනරුත්ථාපන වැඩ සටහන් අගැයීම පිණිස ,

තුන්දෙනෙකුට නොවැඩි තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත තුලනීක්ෂණ මූලමණ්ඩල, එන්.ඩී.ඩී.සී.බී. විසින් නම් කරනු ලැබිය යුතු ය.

(3) තුලනීක්ෂණ මූලමණ්ඩලවල බලතල සහ කාර්යය නියෝග මගින් නියම කරනු ලබන ආකාරයට විය යුතු ය.

නිල අධීක්ෂකයන් පත්කිරීම.

**8**. (1) මේ පනතේ විධිවිධාන යටතේ නාමොද්දේශිත හෝ බලපත්‍රලත් කවර හෝ ප්‍රතිකාර මධ්‍යස්ථානයක නිල අධීක්ෂකයන් ලෙස ක්‍රියා කිරීම සඳහා එන්.ඩී.ඩී.සී.බී. හි නිර්දේශය මත අමාත්‍යවරයා විසින් යෝග්‍ය හා නිසි එක් තැනැත්තකු හෝ තැනැත්තන් වැඩි සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකි ය.

(2) ධුරය දැරීම කලින් අවසන් නොකළහොත් එසේ පත් කරනු ලැබූ සැම නිරීක්ෂකයකු ම ඔහුගේ පත්කිරීමේ දින සිට අවුරුදු දෙකක කාලයක් සඳහා ධුර දැරිය යුතු ය. අවශ්‍ය යයි එවැනි අධීක්ෂකයකුට පෙනීයන විමසීම් හෝ පරීක්ෂණ කිරීම සඳහා එවැනි යම් ප්‍රතිකාර මධ්‍යස්ථානයකට සියලු වේලාවන්හි දී ඇතුළු විය හැකි ය. එම ප්‍රතිකාර මධ්‍යස්ථානවලට වරින් වර යාම සහ මේ කාර්යය සඳහා නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ හෝ නියෝගවලට අනුකූලව කාලාන්තරීය වාර්තා එන්.ඩී.ඩී.සී.බී. වෙත ඉදිරිපත් කිරීම එම අධීක්ෂකයන්ගේ කාර්යය වන්නේ ය.

## II වන කොටස

## ප්‍රතිකාර මධ්‍යස්ථානයකට ස්වේච්ඡාවෙන් ඇතුළත් වීම

ස්වේච්ඡාවෙන් ඇතුළත් වීම.

**9**. (1) අන්තරායදායක ඖෂධවලට ඇබ්බැහිවීම සම්බන්ධව ප්‍රතිකාර ලැබීමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන තැනැත්තකුට ප්‍රතිකාර මධ්‍යස්ථානයකට ඇතුළත් වීම සඳහා ඉල්ලුම් කළ හැකි ය. බාල වයස්කරුවකු සම්බන්ධයෙන් වනවිට දෙමාපියන් හෝ භාරකරු විසින් එම බාලවයස්කරු වෙනුවෙන් ඇතුළත්වීම සඳහා ඉල්ලීමක් කළ හැකි ය. එවැනි තැනැත්තකු ප්‍රතිකාර මධ්‍යස්ථානයකට ඇතුළත් කර ගැනීම , තුලනීක්ෂණ මූලමණ්ඩලයක් විසින් තුලනීක්ෂණය කිරීමට යටත්ව, එක් එක් කාරණය වෙන වෙනම සලකා බැලීමේ පදනම මත තීරණය කළ යුතු ය.

(2) ඇතුළත් කර ගැනීමෙන් පසුව, ඒ තැනැත්තා ප්‍රතිකාර මධ්‍යස්ථානයක ලබාගන්නා ප්‍රතිකාර මාලාව සාර්ථකව සම්පූර්ණ කර ඇති බව සහ එයින් මුදා හරිනු ලැබිය හැකි බව තුලනීක්ෂණ මූලමණ්ඩලයේ සහ ප්‍රතිකාර මධ්‍යස්ථානය භාර වෛද්‍ය නිලධරයාගේ මතය වන තෙක් ඔහුට ප්‍රතිකාර මධ්‍යස්ථානයෙහි නේවාසිකයකු ලෙස සිටිය හැකි ය. මුදාහැරීම සඳහා වූ කොන්දේසි, එක් එක් ප්‍රතිකාර මධ්‍යස්ථානයේ රීති මගින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

## III වන කොටස

## ප්‍රතිකාර මධ්‍යස්ථානයකට අනිවාර්යයෙන් ඇතුළත් කිරීම

**10**. (1) යම් තැනැත්තෙක් අන්තරායදායක ඖෂධ පුරුද්දක් වශයෙන් පාවිච්චි කරන්නකු බව හා එහෙයින් අන්තරායදායක ඖෂධවලට ඇබ්බැහිවූවකු බවට පත්ව ඇති බවට පොලිස් ස්ථානයක ස්ථාන භාර නිලධරයකුට තොරතුරු ලැබුණු අවස්ථාවක රජයේ වෛද්‍ය නිලධරයකු ලවා ඒ තැනැත්තා පරීක්ෂා කරවීමට අවශ්‍ය පියවර ඒ නිලධරයා විසින් ගනු ලැබිය යුතු ය. එසේ යොමු කරනු ලැබූ විට, එම රජයේ වෛද්‍ය නිලධරයා විසින්, එම පරීක්ෂණයේ ප්‍රතිඵල දැක්වෙන වාර්තාවක්, එම අන්තරායදායක ඖෂධවලට ඇබ්බැහි තැනැත්තා තමා වෙත යොමුකළ පොලිස් නිලධරයකු වෙත හෝ අදාළ පොලිස් ස්ථානයට අනුයුක්ත වෙනත් යම් නිලධරයකු වෙත ඉදිරිපත් කළ යුතු ය. එම වාර්තාවෙහි, අදාළ තැනැත්තා අන්තරායදායක ඖෂධවලට ඇබ්බැහි තැනැත්තකු ද නැද්ද යන්න පිළිබඳව වෛද්‍ය නිලධරයාගේ නිරීක්ෂණවලට හේතු ඇතුළත් විය යුතු අතර, ඒ තැනැත්තාගේ ඇබ්බැහිවීමේ ප්‍රමාණය පිළිබඳ විස්තර ඇතුළත් විය යුතු ය. එම වාර්තාව ස්ථාන භාර නිලධාරියා නොවන නිලධරයකු වෙත ඉදිරිපත් කළ අවස්ථාවක, එම තොරතුරු දැනුම් දෙනු ලැබූ බව, පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධරයා වෙත එම නිලධරයා විසින් වාර්තා කළ යුතු ය.

ප්‍රතිකාර මධ්‍යස්ථානයකට අනිවාර්යයෙන් ඇතුළත් කිරීම.

(2) රජයේ වෛද්‍ය නිලධරයාගේ වාර්තාව අනුව ඔහු විසින් පරීක්ෂා කරනු ලැබූ තැනැත්තා අන්තරායදායක ඖෂධවලට ඇබ්බැහි තැනැත්තෙක් නම්, පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධරයා විසින් එම තැනැත්තා මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කළ යුතු හෝ ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයා මේ වගන්තියේ පහත දැක්වෙන විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු ය.

(3) (1) වන හා (2) වන උපවගන්තිවල දැක්වෙන ක්‍රියා මාර්ග සම්පූර්ණ කිරීමෙන් අනතුරුව යම් තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරනු ලැබූ විට, ඒ තැනැත්තා, මහෙස්ත්‍රාත්වරයා විසින් තීරණය කරනු ලබන මේ පනත යටතේ නාමෝද්දිෂ්ට හෝ බලපත්‍රලත් ප්‍රතිකාර මධ්‍යස්ථානයක දී අනිවාර්ය ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය සඳහා යවන ලෙස ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥා කළ යුතු ය.

(4) යම් තැනැත්තකු, (214 වන අධිකාරය වූ ) විෂ ද්‍රව්‍ය, අබිං සහ අන්තරායදායක ඖෂධ ආඥාපනත යටතේ යම් වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබ දඬුවම් නියම කොට ඇත්තා වූ ද, අධිකරණය ඉදිරියේ දිවුරුම් පිට දෙනු ලැබූ සාක්ෂි අනුව ඒ තැනැත්තා අන්තරායදායක ඖෂධවලට ඇබ්බැහි තැනැත්තකු බවට අධිකරණය

සෑහීමට පත්වන්නා වූ ද අවස්ථාවක, අදාළ තැනැත්තාගේ ඇබ්බැහිවීමේ ප්‍රමාණය සැලකිල්ලට ගෙන තීරණය කරන යම් කාලසීමාවකට, අධිකරණය විසින් ඒ තැනැත්තා ප්‍රතිකාර මධ්‍යස්ථානයකට භාරදිය හැකි ය. ඒ තැනැත්තා භාර දෙනු ලැබූ ප්‍රතිකාර මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයාගේ ඉල්ලීමක් මත, එම කාලසීමාව දීර්ඝ කරනු ලැබිය හැකි ය. එසේ කාලය දීර්ඝ කිරීම අවශ්‍ය වීමට, එම දීර්ඝ කිරීම ඉල්ලා සිටීමට පාදක වූ අවස්ථාගත කරුණු අධිකරණයේ මතය අනුව ප්‍රමාණවත් විය යුතු ය.

ඒසේ වුව ද, අදාළ තැනැත්තා ප්‍රතිකාර ලබා ඇති කාලය නියම කර ඇති දඬුවමේ කොටසක් වශයෙන් අධිකරණය විසින්, සැළකිල්ලට ගත හැකි ය.

(5) යම් තැනැත්තකු (4) වන උපවගන්තිය යටතේ ප්‍රතිකාර සඳහා භාරදීමේ ආඥාවක් කරනු ලැබූ අවස්ථාවක, බන්ධනාගාර කොමසාරිස්වරයා විසින් ප්‍රතිකාර මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා විමසා, අධිකරණය නිශ්චය කරන කාලසීමාවක් සඳහා ප්‍රතිකාර ලැබීම සඳහා ඒ තැනැත්තා බන්ධනාගාර ප්‍රතිකාර මධ්‍යස්ථානය වෙත මාරුකිරීම සඳහා පියවර ගත යුතු ය.

(6) මේ වගන්තිය යටතේ නමෝද්දිෂ්ඨ ප්‍රතිකාර මධ්‍යස්ථානයකට ඇතුළත් කර ගනු ලැබූ තැනැත්තකු, 7 වන වගන්තිය යටතේ පත් කරනු ලබන තුලනීක්ෂණ මූලමණ්ඩලයක් විසින්, කලින් කළ තුලනීක්ෂණය කරනු ලැබීමට යටත් විය යුතු ය.

මධ්‍යස්ථානවලින් තැනැත්තන් මුදාහැරීම.

11. (1) මේ පනතේ මීට ඉහතින් වූ විධිවිධාන යටතේ ප්‍රතිකාර මධ්‍යස්ථානයකට ඇතුළත් කරගෙන ඇති යම් තැනැත්තන්, තුලනීක්ෂණ මූලමණ්ඩලය විමසා ප්‍රතිකාර මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා කරනු ලබන නිර්දේශය මත සහ එන්.ඩී.ඩී.සී.බී. හි යම් නියමයන් ට හා කොන්දේසිවලට යටත් ව, එම ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් මුදා හරිනු ලැබිය හැකි ය.

(2) අධිකරණ ආඥාවක් ප්‍රකාර ප්‍රතිකාර මධ්‍යස්ථානයක රඳවා ගන්නා ලද අන්තරායදායක ඖෂධවලට ඇබ්බැහි තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඒ තැනැත්තා රඳවා තබා ගැනීමට නියම කරනු ලැබූ ප්‍රතිකාර මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා විසින් තුලනීක්ෂණ මූලමණ්ඩලය විසින් විමසීමෙන් පසුව කරනු ලැබූ නිර්දේශය අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ විට, ඒ තැනැත්තා මුදා හරින ලෙස අධිකරණය විසින් ආඥාවක් කළ හැකිය. ඒ අධිකරණ ආඥාව, අවශ්‍ය අවස්ථාවල දී අධිකරණය විසින් නියම කරනු ලබන කොන්දේසිවලට යටත් කළ හැකි ය.

## IV කොටස

### සාමාන්‍ය

**12.** පනතේ විධිවිධාන යටතේ නාමෝද්දිෂ්ට හෝ බලපත්‍ර ලත් යම් ප්‍රතිකාර මධ්‍යස්ථානයක් අනිසි කළමනාකාරීත්වයෙන් යුක්ත බව හෝ පනතින් පනවා ඇති නියමයක් හෝ පනත යටතේ නිකුත් කළ විධානයක් කඩකර ඇති බව පෙනී ගියහොත් එන්.ඩී.ඩී.සී.බී. හි උපදෙස් මත අමාත්‍යවරයා විසින් ඒ ප්‍රතිකාර මධ්‍යස්ථානය වසා දමනු ලැබිය හැකිය.

ප්‍රතිකාර මධ්‍යස්ථාන වසා දැමීම.

**13.** (1) මේ පනත යටතේ වූ ඉල්ලීමක් හෝ ප්‍රතිකාර මධ්‍යස්ථානගත කිරීමක් සනාථ කරන හෝ මේ පනත යටතේ විධිවිධාන සලසා තිබෙන වෙනත් යම් කාර්යයක් සඳහා හෝ වෛද්‍ය සහතිකයක් අත්සන් කරන වෛද්‍ය වෘත්තිකයකු විසින් ඒ සහතිකය අදාළ තැනැත්තා අන්තරායදායක ඖෂධවලට ඇබ්බැහි තැනැත්තකු බවට වූ සිය මතයට පදනම් කරගත් කරුණු, ඒ සහතිකයේ නිශ්චිතව සඳහන් කළ යුතු ය. වෙනත් අය විසින් වෛද්‍යවරයා වෙත දැනුම් දෙන ලද කරුණු අනුව ඔහුට පෙනෙන අවස්ථාගත කරුණු ද ඔහු විසින් සවිස්තරව ගෙනහැර දැක්විය යුතු ය.

වෛද්‍ය වෘත්තිකයා ඔහුගේ මතයට පදනම නිශ්චිතව සඳහන් කළ යුතු බව.

(2) වෙනත් අය සන්නිවේදනය කරන ලද කරුණු මත පමණක් පදනම් වී ඇති බවට උද්දේශිත සහතිකයක් මත මහෙස්ත්‍රාත්වරයකු විසින් කිසිම ආඥාවක් නොකළ යුතු ය.

**14.** ප්‍රතිකාර මධ්‍යස්ථානයකට අවසරයකින් තොරව යම් අන්තරායදායක ඖෂධ හෝ යම් අනවසර ද්‍රව්‍යයක් හඳුන්වා දෙන හෝ හඳුන්වා දීමට උත්සාහ කරන නැතහොත් ප්‍රතිකාර මධ්‍යස්ථානයක සිටින තැනැත්තකුට යම් අන්තරායදායක ඖෂධයක් හෝ අනවසර ද්‍රව්‍යයක් සපයන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

ඖෂධ සැපයීම යානාදී ය.

**15.** මේ පනත යටතේ සද්භාවයෙන් ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී හෝ මේ පනතේ විධිවිධානවලට අනුකූලව කරන ලද හෝ කරන ලද බවට උද්දේශිත යම් නිර්දේශයක් හෝ නියමයක් ක්‍රියාවේ යෙදවීමේ දී යම් තැනැත්තකු විසින් කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසි නඩුවක් පැවරිය නොහැක්කේ ය.

වගකීමෙන් ආරක්ෂාව.

නඩු කටයුතු වාර්තා අවසර නොමැතිව හා රහස්‍යභාවය නොරැකෙන පරිදි පළ නොකළ යුතු බව.

**16**. (1) කිසිම තැනැත්තකු විසින්, ආසනාරූඪ විනිශ්චයකාරවරයාගේ අවසර ඇතිව හැර, මේ පනත යටතේ වූ යම් නඩු කටයුතු වාර්තාවක් පළ කරනු නොලැබිය යුතු ය.

(2) ප්‍රතිකාර මධ්‍යස්ථානයක් භාරයේ සිටින, අන්තරායදායක ඖෂධ ඇබ්බැහි තැනැත්තකු පිළිබඳ සියලු වාර්තා රහස්‍ය වාර්තා වන අතර, අධිකරණ ආඥාවක් මත හෝ මධ්‍යස්ථානය ඇතුළත සිදු කළ බරපතළ වරදක් විමර්ශනය කිරීම සම්බන්ධයෙන් හැර එම වාර්තා මුදා නොහැරිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තෙක්, මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

ප්‍රතිකාර ලබන තැනැත්තන්ට පහර දීම.

**17**. ප්‍රතිකාර මධ්‍යස්ථානයක ප්‍රතිකාර ලබන යම් තැනැත්තකුට සාධාරණ හේතුවක් නොමැතිව පහර දෙන, තුවාල කරන, වෙනස්කම් කරන හෝ ඒ තැනැත්තකු ඕනෑකමින් නොසලකා හරින, එම මධ්‍යස්ථානයේ සේවයේ නියුක්ත යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

සේවා නියුක්තයන්ට බාධා කිරීම වරදක් බව.

**18**. ප්‍රතිකාර මධ්‍යස්ථානයක සේවයේ නියුක්ත යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ ඔහුගේ කාර්ය ඉටු කිරීමේ දී ඔහුට බාධා කරන හෝ බාධා කිරීමට තැත් කරන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

පලායන තැනැත්තන් අල්ලා ගැනීම.

**19**. (1) මේ පනත යටතේ නාමෝද්දිෂ්ට හෝ බලපත්‍රලත් ප්‍රතිකාර මධ්‍යස්ථානයක ප්‍රතිකාර ලබන යම් තැනැත්තකු මධ්‍යස්ථානයෙන් පලාගියහොත් පොලිස් නිලධරයකු විසින් හෝ මේ පනත යටතේ පත් කරන ලද යම් නිලධරයකු විසින් හෝ ඒ තැනැත්තා අල්ලා ප්‍රතිකාර මධ්‍යස්ථානයට ආපසු භාර දෙනු ලැබිය හැකි ය.

(2) ප්‍රතිකාර මධ්‍යස්ථානයක රඳවාගෙන සිටින තැනැත්තන් අතර, සාමය සහ විනය පවත්වාගෙන යාම ඒ මධ්‍යස්ථානයේ සේවයේ නියුක්ත කර සිටින යම් තැනැත්තකුගේ කාර්යය වන අතර, ඔහු විසින් කරන ලද නීත්‍යානුකූල විධානයකට අවනත කර ගැනීමට බලකිරීම සඳහා සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි ප්‍රමාණයට බලය පාවිච්චි කිරීම ඇතුළුව සියලු උපක්‍රම ඔහු විසින් තත්කාර්යය සඳහා යොදා ගැනීම ඔහුගේ කාර්යය විය යුතු ය.

**20**. මේ පනතේ 14 වන වගන්තිය, 16 වන වගන්තියේ (2) වන උපවගන්තිය, 17 වන වගන්තිය සහ 18 වන වගන්තිය යටතට වැටෙන වරදක් කරන යම් තැනැත්තකුට මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වන නඩු විභාගයකින් පසු රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකින් හෝ මාස දහඅටක් නොඉක්මවන කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමෙන් හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකින් ම හෝ දඬුවම් කරනු ලැබිය හැකි ය. දණ්ඩනය.

**21**. (1) මේ පනතේ මූලධර්ම සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ සහ ඉටු කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) විශේෂයෙන් ම සහ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කරුණු සඳහා නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) මේ පනත යටතේ බලපත්‍ර නිකුත් කිරීමේ කාර්ය පටිපාටිය ගෙනහැර දැක්වීම ;

(ආ) මේ පනතට අනුකූලව බලපත්‍ර දී තිබෙන හෝ නාමෝද්දිෂ්ට ප්‍රතිකාර මධ්‍යස්ථාන විසින් පිළිපැදිය යුතු නියමයන් ;

(ඇ) එම ප්‍රතිකාර මධ්‍යස්ථානවල පවත්වාගෙන යා යුතු වාර්තා ;

(ඈ) මේ පනතේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වෙනත් යම් කරුණු.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින සිට හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලබන යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක වන්නේ ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු අනුමතිය සඳහා හැකි ඉක්මණින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම, එය යටතේ ඒ දක්වා කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, එම අනනුමතයේ දින සිට ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(5) යම් නියෝගයක් එසේ ප්‍රත්‍යාදිෂ්ඨ කරන ලද දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**22**. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**23**. පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"අන්තරායදායක ඖෂධ" යන්නෙන්, (218 වන අධිකාරය වූ) වස, අබිං සහ අන්තරාදායක ඖෂධ ආඥාපනතේ තුන්වන උපලේඛනය යටතට ගැනෙන ඖෂධ හෝ ඒ වෙනුවට පනවන ලද යම් නීතියක ඇතුළත් ඖෂධ හෝ ඒ වෙනුවට පනවන ලද යම් නීතියක ඇතුළත් ඖෂධ හෝ අදහස් වේ;

"ඖෂධවලට ඇබ්බැහි තැනැත්තා" යන්නෙන්, මේ පනත අදාළවන තැනැත්තෙක් අදහස් වේ;

"ජාතික අන්තරායදායක ඖෂධ පාලන මණ්ඩලය (එන්.ඩී.ඩී.සී.බී.)" යන්නෙන්, 1984 අංක 10 දරන ජාතික අන්තරායදායක ඖෂධ පාලන පනත මගින් පිහිටුවන ලද ජාතික අන්තරායදායක ඖෂධ පාලන මණ්ඩලය, අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.